ලෝකයේ සමස්ත ජනගහණය ගත් විට ආසන්න වශයෙන් බිලියනයක් පමණ දෙනා යම් කිසි වූ ආබාධයක් සහිතව ජීවත් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ලෝක බැංකුව මගින් 2011 දී නිකුත් කළ ලෝක වාර්තාවෙන් දැක්වේ. ඒ හෙයින්, ආබාධ සහිතව ජීවත් වන්නවුන්ට භාෂාව ඔස්සේ හෝ වෙනස් ලෙසින් සැලකුම් නොවීමට වග බලා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වේ.

ආබාධ සහිත වූවන් හැඳින්වීම සඳහා පුද්ගල මූලික භාෂාවක් (Person-first language) යොදාගන්නා ලෙස අප මාධ්‍ය වෙත යෝජනා කරන්නේද ඒ හෙයිනි. පුද්ගල මූලික භාෂාවක් යොදාගනිමින් ආබාධ සහිත වූවන් හැඳින්වීමේදී, ආබාධය දෙවනුවද පුද්ගලයා පළමු කොටද දැක්වෙනු ඇත. උදාහරණ ලෙසින් Disabled person වැනි යෙදුමක් වෙනුවට වඩාත් යෝග්‍ය වන්නේ Person with a disability යන්න බව මේ පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් ඔස්සේ දැක්වේ.

ඒ අනුව ගත් විට, 'ආබාධිත' යන යෙදුමට වෙනුවට වඩා යෝග්‍ය වන්නේ 'ආබාධ සහිත'/'ආබාධයක් සහිත' යන්න නොවේද? එසේ නැතිනම් ඒ සඳහා වඩාත් යෝග්‍ය යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:

https://adata.org/factsheet/ADANN-writing

http://www.disability.wa.gov.au/Global/Publications/Understanding%20disability/words_that_work_media_guide.pdf

https://www.who.int/docs/default-source/documents/disability/world-report-on-disability-factsheet.pdf?sfvrsn=2a22ed1e_2

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima